පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2022 (2023)

විද්‍යාව

ශ්‍රේණිය 6

පාසලේ නම : ....

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ....

....

කාලය : පැය 2 යි.

I කොටස

සැලකිය යුතුයි:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

01. හංගුර ද්‍රව්‍යයකි.

(1) රබර් (2) වීදුරු (3) තඹ

02. පාවහන් සහ ටයර් වැනි ද්‍රව්‍ය නිපදවීමට යොදාගෙන ඇති රබර්වල පවතින භෞතික ගුණය,

(1) ආහන්‍යතාවයයි. (2) ප්‍රත්‍යස්ථතාවයයි. (3) තන්‍යතාවයයි.

03. මෙම රූපයේ දැක්වෙන ක්‍රියාකාරකමින් ලැබෙන නිගමනය වන්නේ,

(1) වාතයට ස්කන්ධයක් ඇති බවයි.

(2) ප්‍රාශ්වාස වාතයේ කාබන්ඩයොක්සයිඩ් ඇති බවයි.

(3) වාතය අවකාශයෙන් ඉඩක් ගන්නා බවයි.



04. පදාර්ථයක් **නොවන්නේ** ,

(1) ශබ්දය වේ. (2) ඇලුමිනියම් වේ. (3) රසදිය වේ.

05. ජෛව ස්කන්ධයකට උදාහරණයකි.

(1) LP වායුව (2) ගල් අඟුරු (3) පොල්කටු

06. භාවිතා කිරීමේ දී පරිසරයට අවම හානියක් ඇතිවන ශක්ති සම්පත වන්නේ,

(1) සූර්යය ශක්තියයි. (2) ජෛව ස්කන්ධයයි. (3) න්‍යෂ්ටික ශක්තියයි.

07. අදීප්ත වස්තුවකි.

(1) සූර්යයා (2) කණාමැදිරියා (3) චන්ද්‍රයා

08. සර්පිනාවේ හඬ නිපදවෙන ආකාරයටම හඬ නිපදවෙන උපකරණයකි.

(1) දවුල (2) ගිටාරය (3) බටනලාව

09. ආලෝකයෙන් ප්‍රයෝජන රාශියක් ඇති අතර ඉන් වැදගත්ම ප්‍රයෝජනය කුමක් ද?

(1) වෛද්‍ය කටයුතු සඳහා යොදා ගැනීමයි.

(2) ශාකවල ආහාර නිපදවීමයි.

(3) සන්නිවේදන කටයුතු සඳහා යොදා ගැනීමයි.

10. ජල ප්‍රභව අනුව ජලය වර්ග කරන්නේ,

(1) කරදිය, මිරිදිය, කිවුල් දිය ලෙසයි.

(2) ඝන, ද්‍රව, වායු ලෙසයි.

(3) වර්ෂණය, මතුපිට ජලය, භූගත ජලය ලෙසයි.

11. ඒකක පරිමාවක අඩුම ලවණ ප්‍රමාණයක් දියවී ඇත්තේ,

(1) ගංගාවක ඇති ජලය තුළයි. (2) කලපුවක ඇති ජලය තුළයි. (3) සාගරයේ ඇති ජලය තුළයි.

12. සංගීත හා ඝෝෂා සඳහා උදාහරණ පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) ගීයක් ගායනය, වයලීනයක් වාදනය

(2) බටනලා වාදනය, රථවාහන ශබ්ද

(3) යන්ත්‍ර සූත්‍රවල ශබ්ද, ළමයින් කෑගසන ශබ්ද

13. පහත දැක්වෙන්නේ සමාන ගුණ ඇති දණ්ඩ චුම්බක 3ක් තබා ඇති ආකාරයයි.



පහත ප්‍රකාශවලින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) A සහ B දණ්ඩ චුම්බක ආකර්ෂණය වන අතර B සහ C දණ්ඩ චුම්බක විකර්ෂණය වේ.

(2) ආකර්ෂණය වීමට වැඩිම හැකියාවක් ඇත්තේ A සහ B දණ්ඩ චුම්බකයි.

(3) ආකර්ෂණය වීමට වැඩිම හැකියාවක් ඇත්තේ B සහ C දණ්ඩ චුම්බකයි.

14. රූපයේ දැක්වෙන ඉලෙක්ට්‍රෝනික උපාංගය වන්නේ,

(1) ඩයෝඩයකි.

(2) ආලෝක විමෝචක ඩයෝඩයකි.

(3) ආලෝක සංවේදී ප්‍රතිරෝධකයකි.

15. සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සියලුම ජීවීන් ශාක මත ඍජුවම යැපේ.

(2) පරිසරයේ නිදහසේ ජීවත් වීමේ අයිතිය ඇත්තේ මිනිසාට පමණි.

(3) පරිසරයේ සමතුලිතතාවයට සෑම ජීවියෙක්ම දායක වේ.

16. මාංශ භක්ෂක හා සර්ව භක්ෂක ජීවියෙකු පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) ගැරඩියා, පොල්කිච්චා (2) වෘකයා, දළඹුවා (3) කටුස්සා, කැරපොත්තා

17. පහත ප්‍රකාශ සලකන්න.

A. සෑම නාය යාමක්ම ස්වාභාවික ආපදාවකි.

B. ගොඩබිමක් තාවකාලිකව ජලයෙන් යටවීම ගංවතුරකි.

C. නියඟය සඳහා ඈත අතීතයේ සිටම මිනිසා පිළියම් යොදා ඇත.

මෙයින් සත්‍ය වන්නේ,

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා A පමණි.

18. රූපයේ දැක්වෙන්නේ,

(1) මාලිමාවකි.

(2) අනිලමානයකි.

(3) ආර්ද්‍රතාමානයකි.

19. වර්ෂාපතනය මනින ඒකකය වන්නේ,

(1) ml වේ. (2) mm වේ. (3) cm වේ.

20. සුළං දිශා දර්ශකයෙහි හී තුඩ නැගෙනහිරට යොමු වී ඇත්නම් සුළං හමන්නේ,

(1) බටහිර සිට නැගෙනහිරට ය. (2) නැගෙනහිර සිට බටහිරට ය. (3) උතුරේ සිට දකුණට ය.

(ල. $2 \times 20 = 40$)

II කොටස

- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 4ක් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමිවේ.**

01. A. 6 ශ්‍රේණියේ ජනිත් විසින් නිරීක්ෂණය කරන ලද ගොවිපල පරිසරයක රූපයක් පහත දැක්වේ.



i. ගොවිපලෙහි ඇති ජීවී ද්‍රව්‍යයක් සහ අජීවී ද්‍රව්‍යයක් ලියන්න.

ජීවී - .... අජීවී - .... (ල. 02)

ii. ගොවිපල පවත්වාගෙන යාමේ දී ලැබෙන මිලෙන් අඩු ශක්ති ප්‍රභවයක් නම් කරන්න.

.... (ල. 02)

iii. මෙම පරිසරයේ දී ඇසීමට ඉඩ තිබෙන ස්වාභාවික ශබ්දයක් හා කෘත්‍රිම ශබ්දයක් ලියන්න.

ස්වාභාවික - .... කෘත්‍රිම - .... (ල. 02)

iv. ගොවිපලෙහි වැට සඳහා යකඩ යොදා ගෙන ඇත්තේ යකඩවල කුමන භෞතික ගුණයක් නිසා ද?

.... (ල. 01)

v. පොකුණු ජලයේ සිටින ඇසට නොපෙනෙන ජීවීන් නිරීක්ෂණයට යොදා ගන්නා උපකරණය කුමක් ද?

.... (ල. 01)

B. පරිසරයේ සිටින සියලුම ජීවීන්, ජීවී ලක්ෂණ පෙන්වයි.



i. මෙම රූපයෙන් දැක්වෙන ජීවී ලක්ෂණය කුමක් ද?

.... (ල. 01)

ii. පෝෂණය අනුව ජීවීන් කාණ්ඩ කළ විට ශාක අයත්වන කාණ්ඩය කුමක් ද?

.... (ල. 01)

iii. ශාකවල ආහාර නිපදවීමට පරිසරයෙන් ගන්නා පදාර්ථ 2ක් ලියන්න.

1. ....

2. .... (ල. 02)

02. පහත සඳහන් වගන්ති අතුරින් නිවැරදි වගන්ති සඳහා (✓) ලකුණත් වැරදි වගන්ති සඳහා (✗) ලකුණත් යොදන්න.

i. ජීවිත කාලය පුරාම ශාක හා සතුන් වර්ධනය වේ. (   )

ii. අවට වස්තූන් පෙනීම සඳහා අවශ්‍ය වන්නේ ඇස පමණි. (   )

iii. ශබ්දය, ශක්ති ප්‍රභේදයකි. (   )

iv. තීව්‍රව ශබ්දය ශ්‍රවණයට කන් පෙති උපකාරී වේ. (   )

v. පරිසරයේ සමතුලිතතාවයට ආහාර දාම වැදගත් වේ. (   )

vi. පෙට්‍රෝලියම් තෙල් සීඝ්‍රයෙන් ක්ෂයවන ෆොසිල ඉන්ධනයකි. (   )

vii. ආලෝකය පාරභාසක ද්‍රව්‍ය තුළින් හොඳින් ගමන් කරයි. (   )

viii. පානීය ජලය ලෙස බහුලව භාවිතා කරන්නේ භූගත ජලයයි. (   )

ix. ද්වි ලෝහ පටියක් මගින් විදුලි ඉස්ත්‍රික්කයේ රත්වීම පාලනය කරයි. (   )

x. ඊයම් සහ ඇලුමිනියම් කැබලි වෙන් කිරීමට චුම්බක යොදා ගත හැක. (   )

xi. අනාගතයට ඉතිරි කරමින් ශක්ති ප්‍රභව භාවිතය තිරසාර භාවිතයයි. (   )

xii. වලයාකාර චුම්බක, ස්පීකර්වල දැකිය හැකි ය. (   )

(ල. 01 × 12=12)

03. A. පහත දැක්වෙන දෙබෙදුම් සුචිය සම්පූර්ණ කරන්න.



(ල. 06)

B. තාපන ඵලයක් පරීක්ෂා කිරීමට ශිෂ්‍යයෙක් සිදු කළ ක්‍රියාකාරකමක, ආරම්භක අවස්ථාවේ පැවති ආකාරය රූපයේ දැක්වේ.



i. මෙහිදී පරීක්ෂා කළ තාපන ඵලය කුමක් ද?

.... (ල. 01)

ii. ස්වල්ප වේලාවකට පසු මෙහි දක්නට ලැබෙන නිරීක්ෂණයක් ලියන්න. (ල. 01)

....

iii. ඉහත නිරීක්ෂණය අනුව උෂ්ණත්වමානයක් සෑදීමට වඩාත් සුදුසු ද්‍රවය කුමක් ද? (ල. 02)

....

iv. ඉහත පරීක්ෂා කළ තාපන ඵලය හැර ඔබ දන්නා වෙනත් තාපන ඵලයක් ලියන්න. (ල. 01)

....

v. තාපය නිසා පරිසරයේ සිදුවන සිදුවීමක් ලියන්න. (ල. 01)

....

04. A. ආලෝකය සම්බන්ධ ක්‍රියාකාරකමක් සඳහා සිදු කළ පරීක්ෂණ 2ක් පහත දැක්වේ.



1 පරීක්ෂණය   2 පරීක්ෂණය

i. ඉහත පරීක්ෂණවල දී ලැබෙන නිරීක්ෂණ ලියන්න.

1 පරීක්ෂණය..

2 පරීක්ෂණය .... (ල. 02)

ii. එම නිරීක්ෂණවලින් පැහැදිලි වන ආලෝකය සතු ගුණය කුමක් ද?

.... (ල. 01)

iii. ආලෝකයේ ප්‍රයෝජනයක් ලියන්න.

.... (ල. 01)

iv. ඔබ දන්නා ස්වාභාවික ආලෝක ප්‍රභවයක් නම් කරන්න.

.... (ල. 01)

v. ප්‍රකාශ තන්තු භාවිතාකර නිපදවා ඇති, වෛද්‍ය විද්‍යාවේ භාවිතාවන උපකරණයක් නම් කරන්න.

.... (ල. 01)

B. සුවපහසු දිවියකට අපට විදුලිය අත්‍යාවශ්‍ය වේ. පහත දැක්වෙන්නේ විදුලිය නිපදවීමට විද්‍යාගාරයේ සිදු කළ ක්‍රියාකාරකමකි.



i. X හා Y තහඩු නම් කරන්න.

.... (ල. 02)

ii. ස්විච්චය ක්‍රියාත්මක කළවිට බල්බය දැල්වීමට අමතරව දක්නට ලැබෙන වෙනත් නිරීක්ෂණයක් ලියන්න.

.... (ල. 01)

iii. ද්විතියික කෝෂයකට උදාහරණයක් ලියන්න.

.... (ල. 01)

iv. විදුලිය සංරක්ෂණය සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ගයක් ලියන්න.

.... (ල. 01)

v. විදුලි අනතුරු වළක්වා ගැනීමට ගත හැකි පියවරක් ලියන්න.

.... (ල. 01)

05. A. ඉලෙක්ට්‍රෝනික උපාංගයක ක්‍රියාකාරිත්වය අවබෝධ කර ගැනීමට සකස් කළ විදුලි පරිපථයක් පහත දැක්වේ.



i. Q ලෙස සඳහන් ඉලෙක්ට්‍රෝනික උපාංගය නම් කරන්න.

.... (ල. 01)

ii. ස්විච්චය ක්‍රියාත්මක කළවිට දැල්වෙන බල්බය කුමක් ද?

.... (ල. 02)

iii. Q උපාංගයේ කාර්යය කුමක් ද?

.... (ල. 01)

iv. පරිපථයේ ගලායන විදුලි ධාරාව පාලනය කිරීමට යොදා ගත හැකි ඉලෙක්ට්‍රෝනික උපාංගය කුමක් ද?

.... (ල. 02)

v. ඉතා හොඳ විද්‍යුත් සන්නායකයක් නම් කරන්න.

.... (ල. 01)

B. "අ" කොටසේ ඇති ප්‍රකාශයට ගැලපෙන වචනය "ආ" කොටසින් තෝරා යා කරන්න.

අ	ආ
1. වායුගෝලයේ ජලය පවතින ආකාරයකි.	ලිඳ
2. ලවණතාවය වැඩි ජලය ඇති ස්ථානයකි.	ජල වාෂ්ප
3. භූගත ජලය ඇති ස්ථානයකි.	ග්ලැසියර්
4. ඝන අවස්ථාවේ ඇති ජලයට උදාහරණයකි.	හුමාලය
5. ජලය පවතින වායු අවස්ථාවකි.	මුහුද
6. වර්ෂණයේ එක් ආකාරයකි.	හිම

(ල. 01 × 06 = 06)

06. A. පහත ඡේදයේ හිස්තැනට ගැලපෙන වචනය යටින් ඉරක් අඳින්න.

අප අවට පරිසරයේ වායුගෝලීය තත්ත්වය නිතර වෙනස් වේ. නිශ්චිත ස්ථානයක කෙටිකාලීන වායුගෝලීය තත්ත්වය .... (කාලගුණය/ දේශගුණය) ලෙස හඳුන්වයි. දිගු කාලීන වායුගෝලීය තත්ත්වය පිළිබඳ අදහසක් ලබා ගැනීමට නම් වසර 30ක වත් .... (කාලගුණික/ දේශගුණික) තොරතුරු රැස් කළ යුතුය. වායුගෝලයේ ජල වාෂ්ප ප්‍රමාණය මැනීමට .... (වර්ෂාමානය/ ආර්ද්‍රතාමානය) භාවිතා කළ හැකි ය. වර්ෂාපතනය මැනීමේ දී .... (දින 24/ දින 1) ක දී ලැබුණු වර්ෂාවේ ප්‍රමාණය මනිනු ලබයි. තාක්ෂණයේ දියුණුවත් සමඟ ස්වාභාවික ආපදාවලින් සිදුවන හානි .... (වැළැක්වීමට/ අවම කිරීමට) හැකි වී ඇත.

(ල. $01 \times 05 = 05$)

B. පරිසරයක ඇති ආහාර ජාලයක් පහත දැක්වේ.



i. X සඳහා සුදුසු ජීවියෙක් නම් කරන්න.

.... (ල. 01)

ii. මෙම ආහාර ජාලයේ සිටින සර්ව භක්ෂක ජීවියෙකු නම් කරන්න.

.... (ල. 01)

iii. ඉහත ආහාර ජාලය ඇසුරින් යැපෙන්නන් 3ක් සහිත ආහාර දාමයක් ගොඩ නගන්න.

.... (ල. 04)

iv. මිනිස් ඇසුරේ සිටීමෙන් භෝජන විලාසය වෙනස් වූ ඔබ දන්නා ජීවියෙකු ලියන්න.

(ල. 01)

....

★★★

ශ්‍රේණිය 6

අවසාන වාර පරීක්ෂණය - 2022

විද්‍යාව

පාසලේ නම : ....

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ....
....

කාලය : පැය 2 යි.

පිළිතුරු පත්‍රය

I කොටස

ප්‍රශ්න අංඃ	පිළිතුරු අංඃ	ප්‍රශ්න අංඃ	පිළිතුරු අංඃ
(01)	2	(11)	1
(02)	2	(12)	2
(03)	3	(13)	2
(04)	1	(14)	3
(05)	3	(15)	3
(06)	1	(16)	1
(07)	3	(17)	2
(08)	3	(18)	3
(09)	2	(19)	2
(10)	3	(20)	2

(ල. 2 × 20=40)

II කොටස

(01) A. i. ජීවී - ගවයා, උෟරා, ළමයා, ශාක වැනි අජීවී - ට්‍රැක්ටරය, ගුවන්යානය, මෝටර් රථය වැනි (ල. 02)

ii. ජෛව ස්කන්ධ (ල. 02)

iii. ස්වභාවික - සතුන්ගේ කෑගසන හඬ කෘත්‍රිම - වාහනවල ශබ්ද (ට්‍රැක්ටර්, ගුවන්යානා) (ල. 02)

iv. දෘඩි බව (ල. 01)

v. සංයුක්ත ආලෝක අණ්වීක්ෂය (අණ්වීක්ෂයට පමණක් ලියා ඇතිවිට ලකුණු නැත) (ල. 01)

B. i. වර්ධනය (ල. 01)

ii. ස්වයංපෝෂීන් (ල. 01)

iii. 1. ජලය

2. කාබන්ඩයොක්සයිඩ් වායුව (ල. 02)

(02) i. (✗) iv. (✓) vii. (✗) x. (✗)

ii. (✗) v. (✓) viii. (✓) xi. (✓)

iii. (✓) vi. (✓) ix. (✓) xii. (✓) (ල. 1 × 12=12)

(03) A. i. 1. පාද ඇති 2. ගවයා 3. පාද නැති 4. හොටක් ඇති 5. හොටක් නැති 6. වරල් ඇති (ල. 1 × 6=6)

★ දෙබෙදුම් සූචියේ හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

B. i. (ද්‍රව) ප්‍රසාරණය (ල. 01)

ii. සිහින් වීදුරු නාලය දිගේ ජලය හා මධ්‍යසාර ඉහළ යාම (ල. 01)

iii. මධ්‍යසාර (ල. 02)

iv. උෂ්ණත්වය ඉහළ යාම, අවස්ථා විපර්යාස, වර්ණ වෙනස් වීම වැනි පිළිතුරක් (ල. 01)

v. පොළොව ඉරි තැලීම, ලැව් ගිනි, සාගර දියවැල් ඇතිවීම වැනි පිළිතුරක් (ල. 01)

(04) A. i. 1- ඉටිපන්දම් දැල්ල පෙනේ.

2 - ඉටිපන්දම් දැල්ල නොපෙනේ. (ල. 02)

ii. සරල රේඛීය ගුණය (ල. 01)

iii. ශාකවල ආහාර නිපදවීම, පෙනීමට, ප්‍රදීපනයට, සංඥා සඳහා, සන්නිවේදන කටයුතු, වෛද්‍ය ක්ෂේත්‍රයට, විනෝදාශ්වාදය සඳහා වැනි පිළිතුරක් (ල. 01)

iv. සූර්යයා, කණාමැදිරියා, ආලෝකය නිකුත් කරන හතු, චන්ද්‍රයා, තාරකා වැනි පිළිතුරක් (ල. 01)

v. එන්ඩස්කෝපය (ල. 01)

B. i. X - සින්ක් තහඩුව Y- කොපර් (තඹ) තහඩු (ල. 02)

ii. ඇමීටරයේ උත්ක්‍රමණය ඇතිවීම, සින්ක් තහඩුව දියවීම (ල. 01)

iii. ඊයම් අම්ල ඇකියුම්ලේටරය, ජංගම දුරකථන බැටරි, සමහර විදුලි පන්දම් බැටරි (ල. 01)

iv. සුදුසු පිළිතුරක් (ල. 01)

v. සුදුසු පිළිතුරක් (ල. 01)

(05) A. i. ඩයෝඩය (ල. 01)

ii. X බල්බය (ල. 02)

iii. විදුලි ධාරාව එක් දිශාවකට ගමන් කිරීමට සැලැස්වීම (ල. 01)

iv. ප්‍රතිරෝධකය (ල. 01)

v. තඹ, ඇලුමිනියම්, රිදී වැනි පිළිතුරක් (ල. 01)

B. i.ජලවාෂ්ප iv. ග්ලැසියර්

ii. මුහුද v. හුමාලය

iii. ලිඳ vi. හිම (ල. 1 × 6=6)

(06) A. i. කාලගුණය

ii. දේශගුණික

iii. ආර්ද්‍රතාමානය

iv. දින 1

v. අවම කිරීමට (ල. 1 × 5=5)

B. i. ශාකයක් හෝ ශාක කොටසක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 01)

ii. මයිනා (ල. 01)

iii. ශාක → තණකොළපෙත්තා → ගෙම්බා → බකමූණා (ල. 04)

iv. බල්ලා / බළලා (ල. 01)

LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න